පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

තුන්වන වාරය ඔක්තොම්බර් - සතිය - 04

ශ්‍රේණිය - 9



සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.



Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School


නිපුණතා මට්ටම : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

අරමුණු -

- එක් එක් ශිල්පියාගේ සේවය සිදු වූ අයුරුවිස්තර කරයි
- එක් එක් ශිල්පියාගේ සේවය හඳුනාගනියි
- දැනුම හා අත්දැකීම් අනෙක් අය හා හුවමාරු කර ගනී
- සතුටින් විවේකය ගත කරයි

ක්‍රියාකාරකම : **<u>නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් අගයමු.</u>**

පළමු පියවර : පහත දී ඇති සටහන කියවන්න.

දෙවන පියවර : එය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකිදැයි බලන්න.

1. එක් එක් ශිල්පියාගේ සේවය සිදු වූ නර්තන සම්ප්‍රදාය නම් කරන්න.
2. ඔවුන්ගේ ජීවන තොරතුරු ඉදිරිපත් කරන්න.
3. නර්තන ශිල්පීන්ගේ සුවිශේෂී කුසලතා මොනවාද ?
4. නර්තනයේ ප්‍රවර්ධනයට ලබාදුන් දායකත්වය කෙබඳුද ?

තුන්වන පියවර : විවිධ ක්‍රමවේදයන් හරහා (පුවත්පත්, ලිපි, සඟරා) ආදිය මඟින් ඔවුන්ගේ විවිධ තොරතුරු( ජීවන තොරතුරු , සුවිශේෂී කුසලතා, නර්තනයේ ප්‍රවර්ධනයට ලබාදුන් දායකත්වය, ඡායාරූප) සොයන්න. එම තොරතුරු ඇසුරුකරගෙන කුඩා පොත් පිංචක් සකසන්න.

සහායක ඉගෙනුම් ආධාරක

- e නැණ පියස - Course: 9 ශ්‍රේණිය නර්තනය
- වෙනත් youtube නාලිකා
    - තාල රංග you tube නාලිකාව - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය නර්තන අංශය
    -
- අතිරේක පොත්/ සඟරා - අත්රේක කියවීම් පොත 9 ශ්‍රේණිය නර්තනය

විල්සන් ඔලබොඩුව ගුරුතුමා :- කළුතර දිස්ත්‍රික්කයේ ඔලබොඩුව නම් ග්‍රාමයෙ ජන්ම ලාභය ලද විල්සන් ප්‍රනාන්දු හෙවත් විල්සන් ඔලබොඩුව මහතා පහතරට නර්තන සම්ප්‍රදායයේ රයිගම් ශෛලිය ප්‍රගුණ කළ නර්තන හා වාදන ශිල්පියෙකි. නර්තන ශිල්පය මෙන් ම වාදන ශිල්පය පිළිබඳ ව ද අති දක්ෂතා ප්‍රකට කළ මෙතුමා උඩරට හා පහතරට බෙර වාදනය මෙන් ම පෙර අපර දෙදිග විවිධ තූර්ය භාණ්ඩ වාදනය කිරීමේ දක්ෂතා දක්වූ වෙක් විය. 60 දශකයේ මුල් භාගයේ දී රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය ට (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය) කථිකාචාර්යවරයකු ලෙස පත් වූ මෙතුමාගෙන් පහතරට නර්තන සම්ප්‍රදායයට සිදු වූ මෙහෙය සුලුපටු නොවේ. විධිමත් ව නොපැවති පහතරට නර්තනයේ හස්ත පාද ක්‍රමවත් ව ගොඩ නැඟීම විල්සන් ඔලබොඩුව මහතාගෙන් සිදු වූ එක් මහඟු මෙහෙවරකි.

එවකට එකී ආචාර්ය මණ්ඩලයේ කටයුතු කළ එස්.එල්.එච්.ප්‍රනාන්දු, කේ.ඇස්. ප්‍රනාන්දු සහ සව්රිස් සිල්වා යන අය සමඟ එක් වී පහතරට නර්තනයේ එතෙක් නොපැවති පා සරඹ හා ඉළංගම් සරඹ නමින් සරඹ පද්ධති දෙකක් නිර්මාණය කිරීමේ ගෞරවය ද එතුමාට හිමි විය යුතු ය.එසේ ම මාතර හා බෙන්තර ශෛලි වශයෙන් පැවති ශුද්ධ මාත්‍රා නැටුමේ පද කොටස් එක් කොට වත්මනෙහි භාවිතයේ පවතින ශුද්ධ මාත්‍රය නිර්මාණය කළේ ද දෙවොල් පද හත හා සුරල් හත ක්‍රමවත් අයුරින් සකස් කළේ ද විල්සන් ඔලබොඩුව මහතාගේ ප්‍රමුඛත්වයෙනි. සාම්ප්‍රදායික නර්තන අංග මෙන් ම නව නර්තනාංග කීපයක් ම නිර්මාණය කොට,''රංගලීල'' නමින් නර්තන ප්‍රසංගයක් පැවැත්වීම ද පහතරට නර්තන කලාවට එතුමාගෙන් සිදු වූ තවත් මහඟු මෙහෙවරක් ලෙස සැලකිය හැකි ය.

අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා :- ඉසෝහාමි හා පොඩි සිංඤෝ යුවළට උපන් දරුවන් දොළොස් දෙනාගෙන් දෙවන පුතා වන අර්නෝලිස් 1925 ගලපිටමඩ ඉඹුල්ගොඩ උපත ලද්දේ ය. 8 වැනි ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලද අර්නෝලිස් මංගලතිරිය ගුරුතුමාගෙන් න්‍ර්තනය ගායනය ප්‍රගුණ කළේ ය. අනතුරු ව අල්ගම කිරිගණිත ගුරුතුමාගෙන් උඩරට නර්තනය හැදෑරූ ඔහු දක්ෂ නර්තන ශිල්පියකු බවට පත් විය. ලංකා ගාන්ධර්ව විභාගය සමත් වී සිටි ඉඹුල්ගොඩ 1951 දී බෙන්තොට ගාමිණී විද්‍යාලයේ නැටුම් උපදේශක ලෙස පත්විය. මේ අතර ඉන්දියාවට ගිය මොහු ශ්‍රී ගෝපි නාත් යටතේ කතකලි නැටුම පිළිබඳ පුහුණුවක් ලැබීය.

රංජනා තංගරාජා යන අය සමග එක් වී විජයාවතරණය, ජානකීහරණය සහ උන්මාද චිත්‍රා යන මුද්‍රා නාට්‍යවල රඟ පෑ ඉඹුල්ගොඩ 1957 උදාව නම් මුද්‍රා නාට්‍යය ද 1961 වේදනා නමැති මුද්‍රා නාට්‍යය ද 1968 රන්දද නමැති මුද්‍රා නාට්‍යය ද නිෂ්පාදනය කළේ ය. 1954 බලපිටිය ගුරු විදුහලේ නැටුම් කථිකාචාර්යවරයකු ලෙස පත් වූ මොහු පසුව 1956 රජයේ ලලිත කලායතනයේ කථාකාචාර්යවරයකු ලෙස කටයුතු කළේ ය. විශ්වවිද්‍යාලයීය ආයතනයක් බවට පත් වූ එම ආයතනයේ ද සේවය කළ ඉඹුල්ගොඩ අතිදක්ෂ උඩරට නර්තන ශිල්පියෙකි. සෙසු නර්තන ශිල්පීන්ට වඩා ඔහුට ම ආවේණික වූ ශෛලියක් අනුව නර්තනය ගොඩනඟා ගැනීම මොහුගේ සුවිශේෂතාවක් ලෙස හැඳින්විය හැකි ය. ඒ මගින් උඩරට නර්තන කලාවෙහි ප්‍රාසංගික භාවය ඉස්මතු කරමින් සම්ප්‍රදාය ට හානියක් නොවන සේ නර්තන නිර්මාණයෙහි යෙදෙමින් උඩරට නර්තන කලාවේ ප්‍රගමනයට ශ්‍රේෂ්ඨ දායකත්වයක් ලබාදීමට කටයුතු කළ ශිල්පියෙකි. මොහුගේ නිර්මාණකරණයේ දී තාලයේ හා රිදමයේ සුසංයෝගයෙන් අපූර්ව සුන්දරත්වයක් මතු කර ගැනීමට සමත් විය. උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් ශාස්ත්‍රීය නර්තන අංග ඒකාකාරී රටාවෙන් බැහැර ව සාම්ප්‍රදායික ලක්ෂණයන්ට සහ එහි අනන්‍යතාවන්ට හානියක් නොවන ආකාරයට වඩාත 'ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීම ද ඔහුගෙන් සිදු වූ තවත් සේවාවක් ලෙස හැඳින්විය හැකි ය. මෙහි දී භාරතීය නර්තනයේ විවිධ හැඩතල හා රිද්ම එක් කොට නවත ම සජීව නර්තන ශෛලියක් බිහි කළේ ය. මොහු ඉතා දක්ෂ ගායකයෙක් ද වූයේ ය. බ්‍රෘනායි, තායිලන්තය සහ ජර්මනිය යන රටවල සංචාරය කරමින් උඩරට නැටුමේ අගය ලොවට හෙළි කළේ ය. 1986 දී ඔහු ජනාධිපතිවරයා අතින්කලාභූෂණ සම්මානය ද හිමි කර ගත්තේ ය.

***

***